# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2013 ඔක්තෝබර් මස 08 වන අඟහරුවාදා

## බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම

පූ.භා. 09.50 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

**පැමිණීම :**

| | |
|---|---|
| ගරු අයි.ඒ. සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ප්‍රසන්න රණතුංග | (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකි රක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බල ශක්ති සහ වෙළඳ විෂයය භාර අමාත්‍යතුමා) |
| ගරු ජගත් අංගගේ | (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා) |
| ගරු උපාලි කොඩිකාර | (ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු නිමල් ලාන්සා | (මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක අමාත්‍යතුමා) |
| ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල | (කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත හා පරිසර කටයුතු අමාත්‍යතුමා) |
| ගරු සුනිල් ජයමිණි | (සභා නායකතුමා) |
| ගරු මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

| | | |
|---|---|---|
| අමරසේකර, ශිරන්ත | ද සිල්වා, අනන්ද හරිශ්චන්ද්‍ර | රහීම්, එම්.එස්.එම්. |
| අල්මේදා, මහේෂ් | ද සිල්වා, ගාමිණී | රහුමාන්, මොහොමඩ් මුජිබර් |
| අබේරත්න, පී.ඩී. | ද සිල්වා, ජයන්ත | රාජකරුණා, හර්ෂණ |
| උඩවත්ත, කීර්ති | ද සිල්වා, පියල් නිශාන්ත | රාජපක්ෂ, තිලකරත්න |
| එල්ලාවල, ලලිත් | ද සිල්වා, සිරිකමල් ෆිලීෂියන් | රාජපක්ෂ, දිලිප් කුමාර |
| කහටපිටිය, කිත්සිරි | ද සිල්වා, සේනක දමයන්ත | රාජේන්ද්‍රන්, එස්. |
| කාරියවසම්, කීර්ති | දේවප්‍රිය, ඉසුර | රාම්, පංචරත්නම් |
| කාරියවසම්, ලයනල් | නිසාම්ඩීන්, එම්. අර්ෂාද් | රූපසිංහ, ආනන්ද රංජිත් |
| කුමරගුරුබරන්, එන්. | පතිරණ, සරත් | ලංකාතිලක මැතිනිය, අශෝකා |
| කුමාර, ජගත් | පියනන්ද ස්ථවිර, පූජ්‍ය තෙඹුවන | වනිගරත්න, ලලිත් |
| කුරුප්පු, කාමල් | පාදුක්ක, නිරෝෂන් | වරාගොඩ, රෙහෙන්සිරි |
| කුරුවිටගේ, මහින්ද | පෙරේරා, තුෂාර | වැලිවත්ත, ජනක් දීපාල් |
| කොටකදෙනිය, එච්.එම්.ජී.බී. | පෙරේරා, දයාකාන්ත | විජේරත්න, උදේන |
| කොස්තා, ජේම්ස් ප්‍රිම්ලස් | පෙරේරා, ප්‍රදීප් | විජයරත්න, මොරිස් |
| කෝරළගේ, යසපාල | පෙරේරා, මෙරිල් | විජේසුන්දර, ශාලිත |
| ගුණරත්න, උපාලි | පෙරේරා, ශ්‍රීනාත් | විජේසේකර, රවී |
| ගුණවර්ධනමැතිනිය, කෝකිලා හර්ශනී | ප්‍රනාන්දු, කිත්සිරි | සරණලාල්, චන්ද්‍රසෝම යූ.ජී. |
| ගුණසේකර, විකුම් | බෙත්මගේ, හෙක්ටර් | සුමනසේකර, සරත් කුමාර |
| චන්ද්‍රභානු, අධිකාරම්ගේ | මතුගමගේ, සුගත් | සූරියබණ්ඩාර, ජානක |
| ජයකොඩි, චන්දන | මල්ලව, නෙලුක් | සෙනෙවිරත්න, රොජර් |
| ජයකොඩි, සිසිර | මවුජූඩ්, අජ්මාල් | ෆයිරූස්, මොහොමඩ් |
| ජයනාත්, ගුණසිරි | මංචනායක, කිත්සිරි | ෆවුසි එම්. නවුසර් |
| ජයසිංහ, ලයනල් | මැන්දිස්, සුමිත් ලාල් | ෆායිස්, මොහොමඩ් |
| තිලකරත්න, හෂාන් | යූසුෆ්, ඒ.එම්. | |

**නොපැමිණීම :**

**ගරු මන්ත්‍රීවරු**

| | | |
|---|---|---|
| අම්ජාඩ්, එම්.එම්.එම්. | ද සොයිසා, විජයමුණි සුමිත් | ලක්තිලක, ශිරාල් |
| උඩුගොඩ, ප්‍රදීප් | පීරිස්, නිමල් ආර්. | වර්ණකුමාර, ලලිත් |
| කුලරත්න, ලාල් | පෙරේරා, අ. ශ්‍රීනාත් ම. | විජේමාන්න, ලක්ෂ්මන් |
| ගමගේ, සලෝචන | පෙරේරා, පෝල් | සකළසූරිය මැතිනිය, චන්ද්‍රිකා ගුණවර්ධන |
| චන්ද්‍රරත්න, නිමල් | ප්‍රනාන්දු මැතිනිය, රෝස් | සිරිවර්ධන මැතිනිය, සන්ධ්‍යා |
| ජයතිස්ස, නලින්ද | ප්‍රියන්ත, විජිත් | සිල්වා, අමල් |
| ජයවර්ධන, නිහාල් | රාජපක්ෂ, වරුණ දීප්ති | |
| තිලකසිරි, ගාමිණී | රොද්‍රිගූ, රන්දීර් | |

## 01. විගණකාධිපති වාර්තා : පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය : 2009

නිමල් ලාන්සා ගරු අමාත්‍යතුමා විසින් පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට අදාළ 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව පිළිගන්වන ලදී.

***ගරු සභාපතිතුමා විසින් එකී විගණකාධිපති වාර්තාව රීති අංක 96(2) අනුව පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට යොමු කරන ලදී.***

## 02. කාරක සභා වාර්තා පිළිගැන්වීම :

2013.09.24 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමා විසින් පිළිගන්වන ලදී.

***පූ.භා. 10.25 ට පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින්, පූ.භා. 11.18 ට යළිත් රැස්විය.***

## 03. පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරී (සංශෝධන) ප්‍රඥප්තිය : දෙවන වර කියවීම.

"2013 අංක ...... දරන බස්නාහිර පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය (සංශෝධන) ප්‍රඥප්තිය."
දෙවන වර කියවීම සඳහා වූ යෝජනාව නිමල් ලාන්සා ගරු අමාත්‍යතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***පූ.භා. 11.19 ට ගරු සභාපතිතුමා විසින් පළාත් සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් කරන ලදී.***

***එවලේ ප්‍රඥප්ති කෙටුම්පතට සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූ බැවින්, ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

## 04. පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරී (සංශෝධන) ප්‍රඥප්තිය : තෙවන වර කියවීම.

"2013 අංක ...... දරන බස්නාහිර පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය (සංශෝධන) ප්‍රඥප්තිය."
තෙවන වර කියවීම සඳහා වූ යෝජනාව නිමල් ලාන්සා ගරු අමාත්‍යතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

***ප්‍රශ්නය විමසන ලදින් සභාසම්මත විය.***

***පූ.භා. 11.21 ට පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් වූයෙන්, ගරු සභාපතිතුමා විසින් පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය වාර්තා කරන ලදී.***

## 05. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : දැනට පවතින මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම.

**ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් සංශෝධිත යෝජනාව රෙහෙන්සිරි වරාගොඩ ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී.**

වර්තමානයේ පවතින පළාත් සභා හා පාර්ලිමේන්තු අනුපාත මැතිවරණ ක්‍රමය ඉදිරිපත් වන අපේක්ෂකයන්ට මෙන්ම ඡන්ද දායකයන්ටද ඉතා අපහසු ගැටළුකාරී මැතිවරණ ක්‍රමයක් වන බැවින්, ඉදිරියේදී පවත්වන සියලු මැතිවරණ නව පළාත් පාලන මැතිවරණ ක්‍රමය මෙන්, පළාත් සභා කොට්ඨාශ මට්ටමින්ද,

පාර්ලිමේන්තු මැතිවරණය ආසන මට්ටමින්ද පැවැත්වීමට කටයුතු කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයට යෝජනා කර සිටියි.

***අනතුරුව, යෝජක ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා විසින් සිය යෝජනාවට පහත සඳහන් සංශෝධනය ද ඉදිරිපත් කරන ලදී.***

*"ජනගහන අනුපාතය අනුව කොට්ඨාශ සංශෝධනය කළ යුතුය"*

***සංශෝධිත ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

## 06. කල් තැබීමේ යෝජනාව :

සුනිල් ජයමිණි ගරු සභානායකතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

ගරු සභාපතිතුමනි, *"දැන් මෙම සභාව කල් තැබිය යුතුය."*

***ඊට අනුකූලව පළාත් සභාව, පූ.භා. 12.38 ට, 2013 ඔක්තෝබර් මස 22 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2013.10.08
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

අව/08